## කොවිඩ් -19 වසංගත තත්ත්වය යටතේ සෞඛ්‍යාරක්ෂිතව පාසල් ආරම්භ කිරීම සඳහා වූ සවිස්තරාත්මක උපදෙස්

රටක අනාගතය දරුවෝ වෙති. ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම නිසා රටක් වශයෙන් මෙරට සංවර්ධනය වසර ගණනාවක් පසුපසට යනු ඇත. එබැවින් කොවිඩ් - 19 වසංගත තත්ත්වය පාලනය කරමින් හා දරුවන් ද ආරක්ෂා කර ගනිමින් නව සාමාන්‍ය තත්ත්වය යටතේ පාසල් සෞඛ්‍යාරක්ෂිත උපදෙස් අනුව ආරම්භ කිරීමට නියමිතය.

ඒ අනුව බස්නාහිර පළාත හා හුදකලා කරන ලද ප්‍රදේශ හැර අනෙකුත් සියලු ප්‍රදේශවල පාසල් 2021 ජනවාරි මස 11 වන දින ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

පාසල්වල අධ්‍යාපන ක්‍රියාවලිය පවත්වාගෙන යාමේ දී අනුගමනය කළයුතු සෞඛ්‍යාරක්ෂිත ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් පහත පරිදි උපදෙස් ලබා දෙනු ලැබේ.

**පූර්ව සූදානම් කටයුතුවල දී පහත කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු ය.**

- පාසල ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සූදානම් වීම සහ ඒ සඳහා වූ සැලසුම් හා උපායමාර්ග සකස් කිරීම.
- පාසලට පිවිසීමේ දී දෑත් සේදීමේ පහසුකම් ස්ථාපිත කිරීම හා පවතින අත් සේදීමේ ස්ථාන භාවිතයට ගත හැකි පරිදි සකස් කර ගැනීම.
- අඛණ්ඩ ජල සැපයුමක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු යෙදීම.
- ඩෙංගු රෝගය පැතිරීම වැළැක්වීම සඳහා පාසල් පරිසරය පිරිසිදු කිරීම හා ජලය රැඳෙන ස්ථාන ඉවත් කිරීම.
- වැසිකිළි හා කැසිකිළිවල පවිත්‍රතාවය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විෂබීජනාශක දියර, සබන් හෝ සබන් දියර ආදිය ප්‍රමාණවත් පරිදි සපයා ගැනීම හා ඒවා අවසන් වන විට සපයා ගැනීමේ වගකීම ගුරුභවතකු වෙත පැවරීම.
- පාසල් පරිසරය, පන්ති කාමර, පිරිසිදු කිරීම හා මේස, පුටු ආදිය විෂබීජනාශක යොදා පිරිසිදු කිරීම.
- කොවිඩ් -19 වසංගත තත්ත්වය යටතේ පාසල් ගුරුවරුන් සහ කාර්යය මණ්ඩලය ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ මහජන සෞඛ්‍ය පරීක්ෂක ගෙන්වා දැනුවත් කිරීම.

**සෞඛ්‍යාරක්ෂිත පාසලක් පවත්වාගෙන යාම සඳහා අවධානය යොමු කළ යුතු කරුණු**

- සිසුන් පාසලට පැමිණීමේ දී මුව ආවරණ පැලඳීම අනිවාර්ය කිරීම සහ පාසල තුළ දී හා පාසලේ සිට නිවසට යන අතරතුරදී ද මුව ආවරණ පැලඳීම අනිවාර්යය බවට දරුවන් දැනුවත් කිරීම සහ එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීම**.**
- පාසලට ඇතුලුවීමේ දී සියලුම සිසුන්ගේ/ කාර්යය මණ්ඩලයේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කර සාමාන්‍ය උෂ්ණත්වයක් (සෙන්ටිග්‍රේඩ් අංශක 37) පවතින්නේ නම් පාසලට ඇතුළත් කිරීම සහ යම් අවස්ථාවක දී උෂ්ණත්වය වැඩි සිසුවකු/කාර්යය මණ්ඩලයේ අයෙකු හමුවූයේ නම් විවේක ගැනීම සඳහා ගිලන් කාමරයට යොමුකර නැවතත් ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීමෙන් පසුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කර උපදෙස් ලබා ගැනීම හා දෙමාපියන් දැනුවත් කිරීම.
- සිසුන් පාසලට ඇතුලුවීමේ දී අත් සේදීම අනිවාර්යය කර පාවහන් **විෂබීජහරණය**ට ලක් කිරීම සහ එය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේදැයි දිනපතා පරීක්ෂා කිරීම.

- පාසලට සිසුන් ඇතුලුවීමේ දී හා පාසලෙන් පිටවීමේ දී ඇතිවන එක්රැස්වීම් වැළැක්වීම සඳහා පාසලේ පවතින අතිරේක පිවිසුම් දොරටු සිසුන් ඇතුළත් කිරීම සහ පිටවීම සඳහා සුදුසු පරිදි යොදා ගැනීම.
- පාසලේ දී සිසුන් එක්රැස්වීම් අවම වන ආකාරයට එය කළමනාකරණය කිරීම සඳහා විදුහල්පතිගේ ප්‍රධානත්වයෙන් අධීක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
- සෑම පාසලකම අවම වශයෙන් එක් ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් සහ මුහුණු ආවරණ පලිහක් (Shield) තබාගැනීම.
- පාසලතුළ දී යම් ආකාරයක කොවිඩ් රෝග ලක්ෂණ සහිත දරුවකු හමුවුවහොත් සෞඛ්‍යාරක්ෂිත ඇඳුම හා මුහුණු ආවරණය සහිත කාර්යය මණ්ඩලයේ අයෙකු විසින් අදාළ දරුවා ගිලන් කාමරය වෙත කැඳවාගෙන ගොස් විවේක ගැනීමට සැලැස්විය යුතු අතර ඒ සමග ම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී / මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කර අවශ්‍ය උපදෙස් ගැනීම.
- දුරස්ථභාවය පවත්වාගනිමින් සිදුකළහැකි ශාරීරික ව්‍යායාම සිදුකිරීම සඳහා යොමු කරවීම, හිතකර ආහාර භාවිතය සඳහා දිරිගැන්වීම සහ දුම්වැටි, මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා සිසුන් දැනුවත් කළ යුතු ය. මෙය දීර්ඝ කාලීනව බෝ නොවන රෝග වළක්වා ගැනීමට හේතු වේ.
- පාසල් ආරම්භ කිරීමෙන් පසු බාහිර පුද්ගලයන් පාසලට ඇතුලුවීම හැකිතාක් අවම කරගත යුතු අතර එසේ පාසල හා සම්බන්ධ වන බාහිර පුද්ගලයන්ගේ නම ලිපිනය හා දුරකථන අංකය සහිත ලේඛනයක් විදුහල්පති විසින් විධිමත් ව නඩත්තු කළ යුතු ය.
- පාසල් නේවාසිකාගාර පවත්වා ගැනීම සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස්වලට අනුකූල ව සිදු කළ යුතු ය.
- ඒ සම්බන්ධ විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති හෝ සහකාර විදුහල්පති යටතේ අධීක්ෂණයට ලක්විය යුතු ය.
- යම් සිසුවකු හෝ සිසුවියක අසනීප තත්ත්වයක් පෙන්නුම් කරයි නම් එම සිසුවා/ සිසුවිය ගිලන් කාමරයට යොමු කළ යුතු අතර කඩිනමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දැනුවත් කර ඔවුන්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. එසේම ඒ පිළිබඳ දෙමාපියන් ද දැනුවත් කළ යුතු ය. එම සිසුවා හෝ සිසුවිය නැවත පාසලට කැඳවීම කළ යුත්තේ සම්පූර්ණයෙන් සුව වූ පසුවය.
- පාසලේ විධිමත් කසල කළමනාකරණ වැඩපිළිවෙළක් පැවතිය යුතු ය.
- පාසල පවත්වාගෙන යාමේ දී හදිසි අවස්ථාවක දී ඇමතීම සඳහා අවශ්‍ය දුරකථන අංක සහ තොරතුරු රැස්කර තම කාර්යාලයේ ප්‍රදර්ශනය කර තැබීම , පාසල් කළමනාකරණ මණ්ඩලය සහ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන භාර ගුරුභවතා දැනුවත් කිරීම. ( සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, පාසල අයත් ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක, පොලිස් ස්ථානාධිපති, ආසන්නතම රෝහල, ග්‍රාම නිලධාරී,ගිලන් රථ සේවා තොරතුරු ආදිය)
- විශේෂ අවස්ථාවක දී 1390 ඇමතීමෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම.
- ගිලන් කාමරය නිරන්තරයෙන් විෂබීජහරණය කර පිරිසිදුව පවත්වාගෙන යාම.
- පාසල් පෝෂණ වැඩසටහන යටතේ ආහාර ලබා දෙන පාසල්වල සැපයුම්කරුවන් පිළිබඳව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ ලබා ගැනීමෙන් පසුව ආහාර ලබා දීමේ වැඩසටහන අඛණ්ඩව පවත්වා ගෙන යාහැකි ය.
- ආහාර සැපයුම්කරුවන්ගේ නිවෙස්වල පුද්ගලයන් ස්වයං නිරෝධායනය වන අවස්ථාවල දී හෝ කැස්ස, උණ, සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග පවතින අවස්ථාවල දී ඒ පිළිබඳ නොපමාව තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් විය යුතු ය.
- එවැනි නිවෙස්වලින් ආහාර රැගෙන ඒම වැළැක්විය යුතු ය. එමෙන්ම ඒ පිළිබඳ නියාමනය කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් විය යුතු ය.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සහ පන්ති කළමනාකරණය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය හා පන්ති කාමරය කළමනාකරණයේ දී සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණු වන්නේ සිසුන් අතර දුරස්ථභාවය ආරක්ෂා කිරීම හා මුව ආවරණ පැලඳීම ඇතුලු සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කිරීමයි.**

- පහත දැක්වෙන පරිදි පුද්ගල දුරස්ථභාවය ආරක්ෂා වන සේ **පන්ති** පැවැත්විය යුතු ය.

| | |
|---|---|
| සිසුන් 15 දක්වා | සෑම දිනකම සියලු පන්ති පැවැත්වීම. |
| සිසුන් 16 - 30 දක්වා | පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර සතියක් හැර සතියක් පන්ති පැවැත්වීම. (මාසයේ පළමු සහ තෙවන සතිය ආදී වශයෙන්) |
| සිසුන් 30 ට වැඩි | ශිෂ්‍යයන් 15 බැගින් කණ්ඩායම් කර සමාන දින සංඛ්‍යාවක් වන සේ පන්ති පැවැත්වීම. |

- සිසුන් සීමිත කණ්ඩායමක් සහිතව පන්ති පැවැත්විය හැකි වන සේ කාලසටහන සකස් කර ගත යුතු ය.
- දුරස්ථභාවය සහිතව සිසුන් රැඳවීම සඳහා පාසලේ පවතින සෑම පන්ති කාමරයක් ම ඉගැන්වීමේ කටයුතු සඳහා භාවිත කළ යුතු ය.
- එසේම, පාසලේ පොදු ඉගැන්වීමේ ස්ථාන ද තෝරාගෙන (ප්‍රධාන ශාලා/ සම්මන්ත්‍රණ ශාලා) නිර්දේශිත දුරස්ථභාවය හා සෞඛ්‍යාරක්ෂිත ක්‍රම උපයෝගී කරගෙන සකසාගත් කාලසටහන පරිදි වැඩි සිසුන් ප්‍රමාණයකට එකවර ඉගැන්වීමේ කටයුතු ආරම්භ කළ හැකි ය.
- සිසුන්ගේ අධ්‍යාපන ක්‍රියාවලියට වාසිදායක වන ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු (සම්මන්ත්‍රණ/ පුනරීක්ෂණ සැසි) අදාළ සෞඛ්‍ය නිර්ණායකවලට අනුකූල වන පරිදි පැවැත්විය හැකි ය.
- පන්ති කාමර සෑම විටම හොඳින් වාතාශ්‍රය ලැබෙන ආකාරයට සකස් කිරීම සහ එළිමහනේ ඉගැන්වීමට ගුරුවරුන් යොමු කිරීම.
- සිසුන් මුහුණට මුහුණ නොසිටින ආකාරයට පන්ති කාමරයේ අසුන් ගැන්වීමේ ක්‍රමවේදය සකස් කිරීම.

## පාසල් විවේක කාලය

- පාසලේ විවේක කාලය සියලු සිසුන් සඳහා එකම වේලාවක දී නොලැබෙන අයුරින් ශිෂ්‍ය සංඛ්‍යාව පදනම්ව විදුහල්පතිගේ අභිමතය හා පාසලට ගැළපෙන අයුරින් සකස් කර ගත හැකි ය.
- ගුරුභවතුන්ගේ අධීක්ෂණයෙන් සිසුන් ආහාර ගැනීමේ දී හුවමාරු කර නොගැනීම සඳහා වැඩපිළිවෙළක් යෙදිය යුතු ය.
- සෑම විටම නිවසෙන් රැගෙන එන ආහාර ගැනීම සඳහා අනුබල දිය යුතු අතර පාසලට පැමිණෙන අතරමග දී ආහාර වර්ග මිලදී ගැනීමෙන් වැළකීම සම්බන්ධව උපදෙස් ලබා දී ඒ පිළිබඳ අධීක්ෂණය කළ යුතු ය.

- පාසල් විවේක කාලයේ දී වුව ද සිසුන් අතර දුරස්ථභාවය ආරක්ෂා කර ගැනීම, මුඛ ආවරණ පැළඳීම එකිනෙකා ස්පර්ශ වන ආකාරයේ අවදානම් සහගත ක්‍රීඩාවන්හි යෙදීම වැළැක්විය යුතු ය.

## ප්‍රවාහන පහසුකම් භාවිත කිරීම

- පා ගමනින්, පා පැදියකින් හෝ දෙමාපියන් සමග යතුරුපැදියකින් යා හැකි දුරක සිටින සෑම අයෙකුම පා ගමනින්/ පා පැදියෙන් යතුරුපැදියෙන් පාසලට යාම ආරක්ෂාකාරී වේ.
- පෞද්ගලික වාහන භාවිත කරන්නේ නම් වාහන තදබදයක් ඇති නොවන ආකාරයට යොදා ගැනීම.
- පොදු ප්‍රවාහන මාධ්‍ය හෝ පාසල් ප්‍රවාහන සේවා භාවිත කරන්නේ නම් එම අවස්ථාවන්හි දී ආසන ගණනට පමණක් ගමන් කිරීම .
- පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීමේ දී රථයට ගොඩවන විට සහ බැසීමෙන් පසු සනීපාරක්ෂක දියර මගින් අත් පිරිසිදු කර ගැනීම , මුඛය නාසය හා ඇස් ස්පර්ශ කිරීමෙන් වැළකීම.
- ප්‍රවාහන සේවා භාවිත කිරීමේ දී රථයේ වායු සමනය රහිතව ජනේල විවෘතව තබා වාතාශ්‍රය ලැබීමට ඉඩ සැලසීම.
- රථය තුළ දී මුඛ ආවරණය ඉවත් නොකිරීම සහ ආහාර වර්ග හුවමාරු කර ගැනීමෙන් වැළකීම.
- රථයට ගොඩවීමෙන් පසුව තමාට හිමි අසුනේ අසුන් ගැනීම සහ වාහනය තුළ අනවශ්‍ය ලෙස ඇවිදීමෙන් වැළකීම.

## ආපන ශාලා විවෘත කිරීම

- නැවත දැනුම් දෙන තුරු පාසල් ආපනශාලා විවෘත කිරීමෙන් වැළකිය යුතු ය.

## පාසල් ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කිරීම

- පාසල් ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉදිරි කාලයේ දී දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

## ගුරුවරුන් සඳහා උපදෙස්

**කොවිඩ් 19 වෛරසයෙන් තමා ද ආරක්ෂා වෙමින් පාසල් සිසුන් ද ආරක්ෂා කර ගැනීම සඳහා සහාය ලබා දීම ගුරුභවතුන්ගේ හා කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාගේ වගකීමකි.**

- පාසල් ආරම්භ කරන පළමු දිනයේ දී සිසුන්ගේ මානසික තත්ත්වය වර්ධනය වන පරිදි හා කොවිඩ් 19 අභියෝග තත්ත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වන පරිදි සුහද පිළිගැනීමක් සිදුකිරීම.
- සිසුන් සඳහා පනවා ඇති සියලුම සෞඛ්‍යාරක්ෂිත උපදෙස් ගුරුවරුන් සඳහා ද අනෙකුත් කාර්යය මණ්ඩලය සඳහා ද එකසේම වලංගු වන අතර අත් සේදීම, ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම හා මුව ආවරණ පැළඳීම ඔවුන්ට ද අනිවාර්ය වේ.
- විදුහල්පතිගේ උපදෙස් මත පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන භාර ගුරුභවතා විසින් ක්‍රියාත්මක කරන දෛනික අධීක්ෂණ වැඩසටහන සඳහා සියලුම ගුරුවරුන් සක්‍රියව සහභාගී වී වගකීම් දැරිය යුතු ය.
- දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු පිළිබඳ මෙන්ම මානසික සෞඛ්‍ය පිළිබඳව ද අවධානය යොමු කර දුරස්ථභාවය ආරක්ෂා කර ගනිමින් මානසික සෞඛ්‍ය ඉහළ නැංවීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම ද ගුරුවරුන්ට පැවරේ.
- දුරස්ථභාවය පවතින අවස්ථාවල දී පමණක් මුව ආවරණය ඉවත් කර සිටීමට අවස්ථාව සැලසීම තුළින් සිසුන්ට ඇතිවන අපහසුතා වැළැක්වීම.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.
- සනීපාරක්ෂක දියර භාවිත කිරීමේදී ආරක්ෂිත ලෙස එය භාවිත කරන ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කිරීම

# සිසුන් සඳහා උපදෙස්

**පවතින අභියෝගයට මුහුණ දෙමින් සෞඛ්‍ය ආරක්ෂිතව අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකරගෙන යාම ඔබගේ වගකීමයි.**

- පාසල් පරිශ්‍රයට පිවිසීමේ දී සබන් ගා අත් සේදීම සහ පාවහන් විෂබීජහරණයට ලක් කිරීම.
- දුරස්ථභාවය පවත්වා ගනිමින් කටයුතු කිරීම.
- පොත්ප ත් පෑන් ආදිය හවුලේ භාවිතයෙන් වැළකීම.
- පාසල් කාලය තුළ අනිවාර්යයෙන් මුව ආවරණ පැළඳීම හා අමතර මුව ආවරණ පොත් බෑගයේ තබා ගැනීම.
- විෂබීජ නාශක දියර (Sanitizer) රැගෙන ඒම හා අවශ්‍ය අවස්ථාවල දී භාවිත කිරීම.
- පාසලේ දී මුව ආවරණ වැඩි වේලාවක් පැළඳිය නොහැකි, අපහසුතා සහිත සිසුන් මුහුණු ආවරණ පලිහ (Face Shield) භාවිත කිරීම.
- ආහාර ගැනීමේ දී හෝ වෙනත් අවස්ථාවක මුව ආවරණය තාවකාලිකව ඉවත් කිරීමේ දී පිරිසිදු කවරයක බහාතැබීම, හෝ ඇඳුමේ රඳවා ගැනීම. මුව ආවරණය කිසිම අවස්ථාවක පොදු ස්ථානවල තැබීම සිදු නොකළ යුතු ය.
- කැස්ස හා කිවිසීමක් ඇතිවන අවස්ථාවල දී වැලමිටෙන් මුව හා නාසය ආවරණය කර ගැනීම හෝ ටිෂු භාවිත කිරීම සහ ඒවා නිසි පරිදි බැහැර කිරීම.
- ආහාර ගැනීම සඳහා හෝ වෙනත් අවස්ථාවක මුව ආවරණය තාවකාලිකව ඉවත් කර නැවත පැළඳීමේ දී දෑත් හොඳින් පිරිසිදු කරගෙන නැවත පැළඳීම සහ අන් අයෙකුගේ මුව ආවරණය කිසිසේත්ම භාවිත නොකිරීම.
- පන්ති කාමරයෙන් ඉවතට ගොස් නැවත පැමිණීමේ දී හෝ කුමන හෝ මතුපිට පෘෂ්ඨයක් ඇල්ලීමෙන් පසු දෑත් සේදීමට කටයුතු කිරීම.
- ආහාර හා ජල බෝතල් හුවමාරු කර ගැනීමෙන් වැළකීම.
- පාසල තුළ හා ඉන් පිටත කණ්ඩායම් වශයෙන් ඒකරාශි වී සිටීමෙන් වැළකීම.
- පාසල නිමා වූ විගස නිවෙස් කරා යාමට කටයුතු කිරීම.
- පාසලට පැමිණීමේ දී හා නිවෙස් කරා යාමේ දී යොදා ගනු ලබන පෞද්ගලික හෝ පොදු ප්‍රවාහන සේවාවන්හි දී සෞඛ්‍යාරක්ෂිත උපදෙස් අනුගමනය කිරීම.
- තමාට යම් අසනීප තත්ත්වයක්, උණ, සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග තත්ත්වයක් පවතින්නේ නම් එම තත්ත්වය මගහැරෙන තුරු පාසලට නොපැමිණීම.
- තම නිවසේ අයෙකු නිරෝධායනය කර ඇත්නම් හෝ කොවිඩ් 19 රෝගියෙකු ඇසුරු කර ඇත්නම් සෞඛ්‍ය උපදෙස් අනුව නැවත දැනුම් දෙනතුරු පාසල් නොපැමිණීම.
- පාසලේ දී හෝ ඉන් බැහැර දී අනවශ්‍ය ලෙස මතුපිට පෘෂ්ඨයන් ඇල්ලීමෙන් වැළකීම.

## දෙමාපියන් සඳහා උපදෙස්

**ඔබගේ දරුවාගේ හා ඔබගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වගවීම සහ පාසල සෞඛ්‍යාරක්ෂිත ලෙස පවත්වාගෙන යාම සඳහා සැම විටම සහය වීම දෙමාපිය වගකීමකි.**

- කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව හෝ උණ වැනි රෝග ලක්ෂණ තිබේනම් තම දරුවන් පාසලට එවීමෙන් වැළකීම.
- නිවසේ වෙනත් සාමාජිකයකු නිරෝධායනය කර ඇත්නම් තම දරුවන් පාසලට එවීමෙන් වැළකීම.
- පවුලේ සාමාජිකයකුගේ හෝ දරුවන්ගේ පී.සි.ආර්. පරීක්ෂණ/ ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ (Rapid Antigen Test ) සිදුකර ඇත්නම් එම වාර්තාව අනුව සෞඛ්‍ය උපදෙස් ලැබෙන තුරු දරුවන් පාසලට එවීමෙන් වැළකී සිටීම.
- හුදකලා කරන ලද ප්‍රදේශවල සිට අනෙකුත් ප්‍රදේශවල පිහිටි පාසල් වෙත දරුවන් එවීමෙන් වැළකී සිටීම.
- තම දරුවා භාවිත කරනු ලබන උපකරණ (පාසල් බෑගය/ වතුර බෝතල්/ කෑම පෙට්ටිය/ පොත්පත් ආදිය) පිරිසිදු කිරීම හෝ අව්වේ දමා වේලා ගැනීම.
- දිනපතා දරුවාගේ ඇඳුම් සහ සපත්තු පිරිසිදු කිරීම.
- පාසල් ගොස් පැමිණි විට දරුවාගේ අත් සේදීම හා දරුවා පිරිසිදු කිරීම.
- පාසලේ සිට නිවසට පැමිණි පසු සපත්තු පිටත ගලවා පැමිණීම.
- භාවිත කර ඉවත දමන මුව ආවරණ ගිනි තබා විනාශ කිරීම.
- කිවිසින විට භාවිත කළ ටිෂූ කඩදාසි, ආවරණය කළ භාජනයකට දමා එකතුකර පුළුස්සා දැමීම.
- නිවසේ දී පිළියෙළ කර ගත් ආහාරපාන පමණක් දරුවාට ලබා දිය යුතු අතර, සැම විටම දරුවා පරිහරණය කරන ද්‍රව්‍ය, පෞද්ගලිකව පරිහරණය කිරීමට උපදෙස් ලබා දීම .
- පාසල නිම වූ විගස තම දරුවන්ට නිවෙස් කරා ඒමට උපදෙස් ලබා දීම/ රැගෙන යාම.
- පාසලට පැමිණීමේ දී හා නිවෙස් කරා යාමේ දී යොදා ගනු ලබන පෞද්ගලික හෝ පොදු ප්‍රවාහන මාධ්‍ය සෞඛ්‍යාරක්ෂිත උපදෙස් අනුව භාවිත කිරීමට තම දරුවන්ට උපදෙස් ලබා දීම.
- තම ප්‍රදේශයේ සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධ යම් ගැටලුවක් පවතින්නේ නම් ඒ පිළිබඳ විදුහල්පති දැනුවත් කිරීම මගින් පාසලට සිදුවිය හැකි අනිසි බලපෑම අවම කර ගැනීම සඳහා සහය වීම.
- දුරස්ථ අධ්‍යාපනය හා සැසඳීමේදී සෘජු පාසල් අධ්‍යාපනය මගින් දරුවන්ට වඩාත් ප්‍රතිපල ලබා දෙන බව දෙමාපියන් දැනුවත් කිරීම ගුරුවරුන්ගේ වගකීමකි.

## පොදු උපදෙස්

**මෙම කරුණු නියමිත පරිදි ඉටු කිරීම විදුහල්පතිවරුන්ගේ වගකීම වේ.**

- විදුහල්පති විසින් පාසලේ පෙර සූදානම් කටයුතු නිවැරදිව මෙම උපදෙස් සංග්‍රහයට අනුව සිදුකර ඒ බව ලොග් සටහනක් තැබීම.

- කොවිඩ් 19 පැතිරීම වැළැක්වීම සඳහා විදුහල්පතිගේ ප්‍රධානත්වයෙන් පාසලේ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව සක්‍රියව පවත්වාගෙන යාම සහ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන භාර නියෝජ්‍ය විදුහල්පති/ ගුරුභවතාගේ මූලිකත්වය යටතේ අඛණ්ඩව නියාමන වැඩසටහනක් ක්‍රියාත්මක කරවීම

- කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ වැඩසටහන සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ලබා දී ඇති අරමුදල් , ද්‍රව්‍ය හෝ උපකරණ පිළිබඳව සහ පාසල ආරක්ෂිත ලෙස ආරම්භ කිරීම වෙනුවෙන් ලබා දී ඇති උපදෙස් පිළිබඳ නිසි පරිදි දෙමාපියන් සහ ආදි ශිෂ්‍යයන් දැනුවත් කිරීම මගින් ඔවුන්ගේ විශ්වාසය තහවුරු කිරීම.

- පාසල ආරම්භ කිරීමට පෙර සෞඛ්‍යාරක්ෂිතබව තහවුරු කිරීමේ පිරික්සුම් ලේඛනය සම්පූර්ණ කර විදුහල්පතිගේ අත්සනින් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දී එහි පිටපතක් පාසලේ ගොනු ගතකර තබා ගත යුතු ය. ( ඇමුණුම 01)

- පාසල ආරම්භ කළ පසු සෞඛ්‍ය ආරක්ෂිත බව තහවුරු කිරීමේ පිරික්සුම් ලේඛනය දෛනිකව සම්පූර්ණ කිරීම ගුරුභවතුන් වෙත පවරා සතියකට වරක් විදුහල්පති අත්සනින් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දී පිටපතක් පාසලේ ගොනුගතකර තබා ගත යුතුය (ඇමුණුම 02)

- සිසුන් සෞඛ්‍යාරක්ෂිතව පාසලට එවීමේ දී අනුගමනය කළ යුතු කරුණු පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීම සම්බන්ධව සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගැනීම.

- කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව හෝ උණ වැනි රෝග ලක්ෂණ තිබේනම් හෝ නිවසේ වෙනත් සාමාජිකයකු නිරෝධායනය කර හෝ පවුලේ සාමාජිකයකුගේ හෝ දරුවන්ගේ පී.සී.ආර්. පරීක්ෂණ/ ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ (Rapid Antigen Test )සිදුකර ඇත්නම් එම වාර්තාව අනුව සෞඛ්‍ය උපදෙස් ලැබෙන තුරු දරුවන් නොඑවන ලෙස දෙමාපියන් දැනුවත් කිරීම.

- අසනීප තත්ත්වයක් හේතුවෙන් නිවසේ රැඳෙන දරුවන් සඳහා එදිනෙදා අධ්‍යාපනික කටයුතු අතපසු නොවන ලෙසට ක්‍රමවේදයක් සකස් කිරීම මගින් දරුවන් නිවසේ රඳවා ගැනීමට දෙමාපියන් පෙළඹවීම.

- පාසලට සිසුන් පැමිණෙන බස්රථ සහ වෑන් රථ පිළිබඳ තොරතුරු රැස් කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ගැනීම.

- නිතර පරිහරණය කරනු ලබන භාණ්ඩ විෂබීජහරණය කිරීම අත් වැටවල් හා දොර අගුලු ආදිය නිරන්තරයෙන් විෂබීජහරණය කිරීම සඳහා වැඩපිළිවෙළක් යෙදීම.

ඉහත උපදෙස්වලට අනුකූලව විධිමත්ව පාසල පවත්වාගෙන යාමටත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීමටත් විදුහල්පතිට වගකීම පැවරෙන අතර මෙම වැඩසටහන අඛණ්ඩව නියාමනය කරමින් හා නියාමන වාර්තා තබා ගනිමින් සෞඛ්‍යාරක්ෂිත පාසලක් බවට පත් කිරීම පාසල් ප්‍රජාව, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ වගකීමක් බව අවධාරණය කර සිටිමි. මෙම වැඩසටහන ක්‍රියාත්මක වීම පිළිබඳ කොට්ඨාස, කලාප හා පළාත් කාර්යාල විසින් අධීක්ෂණය කළ යුතු ය.